# <u>කුරහන් ඉසිමුව කළුවර බලාලා</u>

**විෂයය** : සිංහල භාෂාව හා සාහිත්‍යය

**ශ්‍රේණිය** : 11

**වාරය** : දෙවන වාරය

**නිපුණතාව** : **14.0** සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් රසාස්වාදය හා විචාරය පිළිබඳව හැකියාව ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම** : **13.1** නිර්දිෂ්ට කෘතිවල සාහිත්‍ය පසුබිම ගවේෂණය කරයි.
**14.3** ජනකවිවල සාහිත්‍යමය අගය විමසයි.

## <u>ක්‍රියාකාරකම්</u>

1) "දුරුතු මහේ දී කැලයට වැදීලා
මසක් පමණ කල් කැලවල් කොටාලා
මැදින් දිනේ දී වල් ගිනි තබාලා
කුරහන් ඉසිමුව කළුවර බලාලා"

(අ) මෙහි සඳහන් කුරහන් ගොවියාට ඇති වෙහෙස මහන්සිය කෙබඳු ද?
(ආ) මෙහි සඳහන් පරිදි කුරහන් ඉසීමට කෙතරම් කාලයක් ගත වේ ද?

2) "මා කී දේ දෙයියනි බොරුවක් ම නැති
බිම එළි වුණොත් **<u>කණු මදු</u>** බොහොම ළඟ ඇති
ඇඟට වෙහෙස ඇත **<u>තුන් යමට</u>** නිදි නැති
ගොබ කළු වෙමින් කුරහන් කිරි වැද වැඩෙති"

(අ) ගොවියා නිර්ව්‍යාජ අයෙකු බව ප්‍රකාශ වන කරුණක් ලියන්න.
(ආ) අංකිත පදවල අර්ථ ලියන්න.

3) "කුරක්කන් තුනයි වැපුරුවෙ අමාරුවේ
කපන්ටත් බැරුව අතපය රුදාවේ
අරින්ටත් බැරුව ලොවග ම සිනාවේ
කපමු නැනෙ ඉපනැල්ලේ සුබාවේ"

(අ) කුරහන් ගොවියන් සතු සැප මෙන් ම දුක කවියෙන් ප්‍රකාශ කර ඇති අයුරු පහදන්න.
(ආ) "අරින්ටත් බැරුව ලොවග ම  සිනාවේ" යනුවෙන් කියැවෙන අදහස ලියන්න.

4) කවි ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. "එල්ල වෙන්ට කවි කර කීවෙමි  බොහොම
කොල්ල කන්ට එති සිව්පාවෝ  බොහොම
..........................................................................
.........................................................................."

(අ) කවියේ ඉතිරි පාද සම්පූර්ණ කරන්න.
(ආ) අවසාන පේළියේ අදහස ලියන්න.

ii. " ..................................................................
..................................................................
වැටටත් උඩින් උන් අල්ලන  මලක්කන්
අපොයි මගේ කිරි වදිනා  කුරක්කන්"

(අ) කවියේ මුල් පාද සම්පූර්ණ කරන්න.
(ආ) මෙහි සඳහන් පරිදි කුරහන් ගොවියාට ඇති අභියෝගයක් සඳහන් කරන්න.

iii. "මෙදා හේනෙ පැහිලා ඇති  කුරක්කන්
රන්වන් කරල් බරවී ඇති  සුරක්කන්
..................................................................
.................................................................."

(අ) ඉතිරි දෙපාදය සම්පූර්ණ කරන්න.
(ආ) කුරක්කන් කවියාගේ බලාපොරොත්තුව කුමක් ද ?

5) කුරහන් ගොවියා සතු නිර්ව්‍යාජත්වය ප්‍රකාශ කර ඇති අයුරු

i. ..........................................................................................................
ii. ..........................................................................................................
iii. ..........................................................................................................
iv. ..........................................................................................................
v. ..........................................................................................................

6) භාෂාව සරල බවට උදාහරණ කවිපාද උපුටා දක්වන්න.

i. ..........................................................................................................
ii. ..........................................................................................................
iii. ..........................................................................................................
iv. ..........................................................................................................

7) ධ්වනිතාර්ථවත් පද උපුටා දක්වන්න.

i. .............................................................................................................
ii. .............................................................................................................
iii. .............................................................................................................
iv. .............................................................................................................
v. .............................................................................................................

8) පහත සඳහන් වචනවල අරුත් ලියන්න.

i. දුරුතු මහේ -
ii. කල් කැලවල් කොටාලා -
iii. ඉසිමුව -
iv. ගොල්ල සමග -
v. නිල්ල අඹති -
vi. කණු මදු
vii. තුන් යම
viii. කිරි වැද වැඩෙති -
ix. සුරුක්කන් -
x. සක්මන් -
xi. මලක්කන් -
xii. වළක්කන් -
xiii. රැක ගන්නට -
xiv. පැහිලා ඇත -
xv. සුරක්කන් -
xvi. අවුසදයකි -
xvii. සුබාවේ -
xviii. සරදම් -
xix. නරක්කන් -
xx. ඉපනැල්ල -

9) කුරහන් කවියා අභියෝග ජයගනිමින් තම කාර්යය ඉටුකර ගත් අයුරු කුරහන් කවි ඇසුරින් උදාහරණ තුනක්වත් සහිතව විස්තර කරන්න.

10) ජනකවියා යොදා ගත් භාෂාව කුරහන් කවි රසවත්ව ඉදිරිපත් කිරීමට යොදාගෙන ඇති අයුරු උදාහරණ තුනක් සමග පැහැදිලි කරන්න.

11) කුරහන් කවියාගේ ජීවිතයේ

(අ) අව්‍යාජ බව ප්‍රකට කිරීම

(ආ) ධ්වනිතාර්ථවත් පද භාවිතය

මගින් රසවත්ව නිරූපණය කර ඇති අයුරු එක එකකට උදාහරණ දෙක බැගින් ගෙන විස්තර කරන්න.

12) කුරහන් වගාවේ ආරම්භයේ සිට අවසානය දක්වා ගොවියා මුහුණ දුන් සියලු කරදර බාධක ඇසුරින් උදාහරණ ගෙන කුරහන් ගොවි ජීවිතය පිළිබඳ විස්තර කරන්න.

**<u>පිළිතුරු</u>**

1) .

(අ) මාසයක් වල් කෙටීම, වල් ගිනි තැබීම.

(ආ) මාස තුනක කාලයක්

2) .

(අ) ● පිළිස්සී ඉතිරිවූ ගස්මුල් ඇතිබව

● තුන් යාමයේ නිදි නැති බව

(ආ) ● **කණු මඳු -** පිළිස්සී ඉතිරිවූ ගස්මුල්

● **තුන් යම -** රෑ යාම තුන (පෙරයම, මැදියම, අලුයම)

3) .

(අ) කුරක්කන් තුනක් වැපිරුවත් කපාගන්න නොහැකි තරම් අස්වැන්න ලැබීම.

(ආ) කුරහන් කපා ගැනීමට නොහැකි වුවොත් ලෝකයා සිනාසෙන බව

4) .

i. (අ) ගොල්ල සමග එති ඌරෝ සැමදාම
නිල්ල අඹති සත් දවසින් බැලුවාම
(ආ) දින හතකින් කුරහන් ගස් කොළ පාටින් වැවී ඇති බව

ii. (අ) හේනේ පැලේ මා විඳිනා සුරුක්කන්
ඌරෝ ඇවිත් වටපිට කරති සක්මන්
(ආ) සත්තු ඇවිත් කිරි වදිනා කුරක්කන් විනාශ කරන බව

iii. (අ) ඌරො නොකැවොත් හේනේ කුරක්කන්
බඩගින්නට අවුසදයකි කුරක්කන්
(ආ) ඌරෝ නොකැවොත් ඖෂධයක් බඳු අස්වැන්නක් ලැබෙන බව

5) .

i. බොරු නොකියන බව
ii. ඇහැට වෙහෙස ඇත තුන් යමට නිදි නැති
iii. හේනේ පැලේ විඳින කරදර
iv. කපාගන්නට අපහසු තරමට අස්වනු ලැබීම.
v. එක පෙති කුරක්කන්වලට සරදම් කරන බව

6) .

i. “දුරුතු මහේදී කැලයට වැදීලා”
ii. “හේනේ පැලේ මා විදිනා සුරුක්කන්”
iii. “මෙදා හේනෙ පැහිලා ඇති කුරක්කන්”
iv. “මඟ යන්නෝ මට සරදම් කරක්කන්”

7) .

i. “දුරුතු මහේදී කැලයට වැදීලා”
ii. “හේනේ පැලේ මා විදිනා සුරුක්කන්”
iii. “මෙදා හේනෙ පැහිලා ඇති කුරක්කන්”
iv. “මඟ යන්නෝ මට සරදම් කරක්කන්”
v. “අපොයි මගේ කිරි වදිනා කුරක්කන්”

8) .

i. ජනවාරි මාසයේ
ii. වල් කොටා
iii. වැපිරීම
iv. රංචු පිටින්
v. නිල් පාටට හැරේ
vi. ගිනිගත් පසු ගස්වල ඉතිරි මුල් කොටස්
vii. පෙරයම, මැදියම, අලුයම
viii. පැසී එන / මෝරන
ix. දුක් කරදර
x. සංචරණ / එහාමෙහා යෑම
xi. කරණම්
xii. වැළැක්වීමෙහි
xiii. ආරක්ෂාවට
xiv. මෝරා ඇති
xv. කරදර
xvi. ඔසුවක්
xvii. ආකාරය
xviii. විහිළුව
xix. අයහපත් වැඩ
xx. කුරහන් කපාගත් පසු ඉතිරි වන කොටස

9) ගොවියාගේ දුක ප්‍රකාශ වන, දුක් ගැහැට හැඟීම් බරව ප්‍රකාශ කරන අයුරු -

- සුරුක්කන්
- මලක්කන්
- වැටටත් උඩින් උන් අල්ලන මලක්කන්
- ඌරෙනි නොකා පලයව් මගෙ කුරක්කන්
- අපොයි මගේ කිරි වදිනා කුරක්කන්

10) අභියෝග ජය ගැනීමට කාලයක් මහන්සි විය යුතු බව -

- “දුරුතු මහේදී කැලයට වැදීලා.....”
- “එල්ල වෙන්ට කවි කර කීවෙමි බොහොම......”
- “මා කී දේ දෙයියනි බොරුවක් ම නැති......”

ආදී කවි එක් කරගෙන විචාරය ලියන්න.

11) ජනකවියා සතු භාෂාව සරල හැඟීම් සමග මුසු වූවකි.

- “මැදින් මහේදී වල් ගිනි තබාලා.....”
- “ගොල්ල සමග එති ඌරෝ සැමදාම.....”
- “අපොයි මගේ කිරි වදිනා කුරක්කන්”
- “බඩගින්නට අවුසදයකි කුරක්කන්”

12) (අ) අව්‍යාජ සත්‍ය ජීවිතය කුරහන් ගොවියා පෙන්වා දී ඇති අයුරු -

- “හේනේ පැලේ මා විදිනා සුරුක්කන්....”
  (දුක වේදනාව සත්‍ය ලෙස ප්‍රකාශ වන්නේ අව්‍යාජ බව නිසාය.)
- “කටු ඇල්ලේ මගෙ හේනේ කුරක්කන්.....”
- “ඌරනි නොකා පලයව් මගෙ කුරක්කන්....”
  (සතුන්ගෙන් වන හානිය අව්‍යාජව පෙන්වා දීම.)
- “කුරක්කන් තුනයි වැපිරුවෙ අමාරුවේ.....”
  (දුක වේදනාව අතරට සතුට මුසු වූ අයුරු කවියා අව්‍යාජව පෙන්වාදී ඇත.

(ආ) ධ්වනිතාර්ථවත් පද භාවිතය

- “දුරුතු මහේදී කැලයට වැදීලා.....”
  (කුරහන් ගොවියාගේ අනේකවිධ දුක් ගැහැට මෙ මගින් ප්‍රකාශ වේ)
- “එපෙති දෙපෙති මහ හේනේ කුරක්කන්....”
  (දුක, සතුට, අභියෝග ධ්වනිතාර්ථවත් ලෙස කුරහන් කවියාගේ ජීවිතයෙන් ප්‍රකාශ වන අන්දම)